# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2063/27 – 2018 මාර්තු 21 වැනි බදාදා – 2018.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 129, මුප්පනේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මුප්පනේ (අ.ග.පි. 172) ගමේ පිහිටි මොනරාගල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක එම්ඕ/එම්එන්ආර්/2015/601 හා 2015.10.21 දිනැති ප්‍රමාණයෙන් හෙක්. 0.4360 ක් පමණ වන පහත නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කුමාරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.3001 ක් පමණ**
උතුරට: මාර්ග (මා.සං.අ.) සහ අ.ග.පි. 172 හි කැබලි අංක 80ඒ; නැගෙනහිරට සහ දකුණට: අ.ග.පි. 172 හි කැබලි අංක 80ඒ සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ මාර්ග (මා.සං.අ.).

02. **කැබලි අක්ෂර 'බී' – කුමාරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1359 ක් පමණ**
උතුරට: මාර්ග (මා.සං.අ.) සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ අ.ග.පි. 172 හි කැබලි අංක 1475; දකුණට: අ.ග.පි. 172 හි කැබලි අංක 1475 සහ අ.ග.පි. 172 හි කැබලි අංක 80ඒ; බටහිරට: අ.ග.පි. 172 හි කැබලි අංක 80ඒ සහ මාර්ග (මා.සං.අ.).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2014/එල්ඕ/431.
2017 නොවැම්බර් මස 27 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 – 208

1A – G 27338 – 06 (2018/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*